**IPRC/16/121**

# ළමා ආකල්ප සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට රැගෙන ඒම සඳහා පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

වික්‍රම කංකානම්ගේ දොන් කීර්තිරත්න[1,2*]

පාසල විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් ළමයා ජීවත්වන සමාජය හා බද්ධ වූ සංස්කෘතිය, ප්‍රතිමාන අගයයන් හා හරපද්ධතීන් ඔහු තුළ චරිතායනය කිරීමෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කරයි. එමගින් දිනෙන් දින වර්ධනය වන සදාචාර විරෝධී මිනිස් හැසිරීම් හේතුවෙන් වත්මන් සමාජය තුළ නිර්මාණය කෙරෙන සමාජ ගැටලු රාශියකට පිළියම් සපයයි. එහෙයින්, ළමා ආකල්ප සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට රැගෙන ඒම සඳහා පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිබඳව සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ආගමික කටයුතු, විවිධ ක්‍රීඩා, බාල දක්ෂ, ශිෂ්‍ය භට, ක්ෂේත්‍ර චාරිකා, සමිති සමාගම්, විවිධ සංවිධාන, සඟරා සංස්කරණ, විවාද තරග යනු පාසල හා ඉන් පිටත දී සංවිධානය කෙරෙන විෂය සමගාමී ක්‍රියාකාරකම් වේ. මෙහි දි මාස තුනක් ඇතුළත (ජුනි 28 සිට සැප්තැම්බර් 28 දක්වා) ලංකාවේ ප්‍රධාන පුවත්පත් හා අන්තර්ජාල ලිපි මගින් පළ වූ සිද්ධීන් ඇසුරින් ලබාගත් තොරතුරු දත්ත රැස්කිරීමේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදාගෙන ඇත. ද්විතීයික මූලාශ්‍ර ලෙස විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විවිධ පර්යේෂකයන් විසින් ලියන ලද පර්යේෂණ ලිපි, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල දී ඉදිරිපත් කොට ඇති පර්යේෂණ පත්‍රිකා, යොදා ගන්නා ලදී. එසේ එක්රැස් කළ කරුණු විශ්ලේෂණාත්මකව සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කොට ඇත.

පාසල තුළ දී හා පාසලෙන් පිට දී ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට එළඳායීව දරුවන් යොමු කිරීමෙන් මත්ද්‍රව්‍ය හා මත් වතුර භාවිතය, දුම්පානය, බාල අපරාධ, නව යොවුන් වියේ ගැබ් ගැනීම්, නව යොවුන් වියේ සමලිංගික හැසිරීම්, අක්‍රමණශීලී හා ප්‍රචණ්ඩ හැසිරීම්, සියදිවි නසා ගැනීම්, වෙබ් අඩවි සඳහා අනවසර ඇතුළු වීම්, නිවෙස් හැරයාම්, මානසික පීඩනය, සොරකම් කිරීම් වැනි සමාජ ගැටළු රාශියකට විසඳුම් සෙවිය හැකි බව පර්යේෂණ තොරතුරු විශ්ලේෂණයේ දී තහවුරු වූවකි. ඒ අනුව සහකම්පනශීලී බව, චිත්තවේග පාලනය, සාමූහික බව, සහයෝගයෙන් සතුටුවීම, නීති ගරුක බව, අවංකකම, පරාජය හමුවේ වියරු නොවැටීම මෙන්ම ජයග්‍රහණය හමුවේ නිහතමානී වීම, තවකෙකුගේ ජීවත් වීමේ අයිතිය පිළිගැනීම වැනි ගුණ ධර්ම යහපත් ආකල්ප සංවර්ධනය මගින් වත්මන් සමාජය තුළ ජීවත්වන දරුවන් තුළ රෝපණය කිරීම අතීතයට වඩා වර්තමානයේ සමාජ අවශ්‍යතාවක් බවට පත්ව ඇති බව පර්යේෂණ තොරතුරු මගින් තවදුරටත් අනාවරණය විය. විෂය සමගාමී ක්‍රියාකාරකම් ළමයාව හුදෙක් කුමන හෝ කාර්යයක නිමග්න කරවන්නක් නොව ඔහුගේ ලැදියා, හැකියා, රුචිකත්වය හා අපේක්ෂා හඳුනාගෙන ඒ අනුව ඔහුව නිවැරදි දිශාවකට යොමුකිරීමට සමත් වන්නක් වියයුතු ය. එපමණක් නොව, පාසල් මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී ඉන් අපේක්ෂිත ඉගෙනුම් ඵල මතුවන සේ ඒවා සංවිධානය කළහොත් විශ්වීය සමාජය හා ගැටෙන දරුවා සහකම්පනශීලීව 21වන සියවසේ අභියෝග ජය ගනිමින් වැඩෙන අයෙක් මෙන්ම සමාජයට දැරියහැකි පුද්ගලයෙක් ද වනු ඇත. තව ද, මෙවැනි පර්යේෂණ මගින් ලැබෙන නිගමන හා යෝජනා විෂය සමගාමී ක්‍රියාකාරකම් ඵලදායි ලෙස පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට කිසියම් මඟ පෙන්වීමක් කරනු ඇත.

***ප්‍රමුඛපදඃ*** *විෂය සමගාමී ක්‍රියාකාරකම්, පාසල් පද්ධතිය, ආකල්ප, සමාජ ගැටළු, දැරිය හැකි සමාජ රටාවක් .*

[1] ෂැන්ඩොන්ග් විශ්වවිද්‍යාලය, මහජන චීනය *wkdk1974@yahoo .com
[2] පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, කළුතර, ශ්‍රී ලංකාව